ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024

## කොන්ත්‍රාත් වැඩ, භාණ්ඩ, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සහ සේවා සැපයීම

2024 වර්ෂය සඳහා පහත සඳහන් කොන්ත්‍රාත් වැඩ, භාණ්ඩ, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සහ සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් / බෙදාහරින්නන්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා ව්‍යාපාර ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### කාණ්ඩය 01 - කොන්ත්‍රාත්තු

**උපකාණ්ඩය**

- වාස්තු විද්‍යාත්මක උපදේශනය
- ඉංජිනේරු උපදේශනය
- සිවිල් ඉදිකිරීම්
- අභ්‍යන්තර අලංකරණය
- විදුලි
- පරිගණක සහ ජාලකරණ
- යාන්ත්‍රික

### කාණ්ඩය 02 - භාණ්ඩ

**උපකාණ්ඩය**

- ශ්‍රව්‍ය සහ දෘශ්‍ය උපකරණ
- දුරකථන උපකරණ
- ප්‍රවේශ පාලන පද්ධති
- නිරීක්ෂණ පද්ධති
- පරිගණක, ජාලකරණ උපකරණ සහ උපාංග
- මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් සහ ස්කෑනර්
- මෘදුකාංග පැකේජ
- යන්ත්‍රෝපකරණ සහ උපකරණ
- බඳින පටි (මුදල් නෝට්ටු ඇසිරීම සඳහා)
- විද්‍යුත් මෙවලම් සහ උපාංග
- විදුලි උපකරණ
- යාන්ත්‍රික උපකරණ
- යාන්ත්‍රික මෙවලම් සහ උපාංග
- පුටු සහ සෝෆා
- සාමාන්‍ය ගෘහ භාණ්ඩ සහ අදාළ උපකරණ
- මේස
- ගොඩනැගිලි ද්‍රව්‍ය හා සාමන්‍ය හාර්ඩ් වෙයාර් උපකරණ
- සනීපාරක්ෂක අවශ්‍යතා
- රසායනාගාර උපකරණ
- ෆාමසි/ඖෂධ නිෂ්පාදන
- ශල්‍ය උපකරණ
- වෛද්‍ය සායනික උපකරණ
- සාමාන්‍ය කාර්යාලයීය උපකරණ
- සාමාන්‍ය කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය අයිතම
- කඩදාසි රෝල්
- කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන
- ටෝනර්, කාට්රිජ් සහ රිබන්
- අවන්හල් උපකරණ සහ මුළුතැන්ගෙයි උපකරණ
- ව්‍යායාම් උපකරණ සහ උපාංග
- පුස්තකාල උපකරණ සහ සැපයුම්
- ආරක්ෂිත උපකරණ
- සාමාන්‍ය රෙදිපිළි
- ක්‍රීඩා ඇඳුම්
- නිල ඇඳුම් සහ උපාංග

### කාණ්ඩය 03 - අළුත්වැඩියා සහ නඩත්තු

**උපකාණ්ඩය**

- සාමාන්‍ය අලුත්වැඩියා කටයුතු
- බර යන්ත්‍රෝපකරණ
- ආරක්ෂක උපකරණ
- වාහන

### කාණ්ඩය 04 - සේවා

**උපකාණ්ඩය**

- ප්‍රචාරණය සහ වෙළඳ දැන්වීම්
- ගුවන් ප්‍රවේශපත්‍ර සේවා
- ඉදිකිරීම් ආශ්‍රිත සේවා
- නිෂ්කාශන සේවා (Clearing and Forwarding)
- උත්සව කළමනාකරණය
- ගෘහ පාලනය
- මාධ්‍ය හා ප්‍රචාරණ සේවා
- කොන්ත්‍රාත් පදනම මත ශ්‍රමය සැපයීම
- භාණ්ඩ එහා මෙහා කිරීමේ සේවා
- වෙනත් සේවා
- වෘත්තිමය සේවා
- මුද්‍රණ සේවා
- ස්කෑන් සේවා
- ඇඳුම් මැසීම
- ප්‍රවාහන සේවා

## අයදුම්කරුවන් සඳහා කොන්දේසි

(i) මිල ගණන් සාමාන්‍යයෙන් කැඳවනු ලබන්නේ ලියාපදිංචි බලයලත් බෙදාහරින්නන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ නිෂ්පාදකයින්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන් ගෙනි. එසේ වුවද, ලියාපදිංචි නොවූ බලයලත් නියෝජිතයින්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ නිෂ්පාදකයින්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය බැංකුව සතු වෙයි.

(ii) ලියාපදිංචිවීම සඳහා ඉල්ලා ඇති අයගේ විශ්වාසවන්තභාවය කෙරෙහි සෑහීමකට පත් නොවුවහොත් එම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතු වෙයි.

(iii) 2023 වර්ෂය සඳහා දැනටමත් බැංකුවේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්, බලයලත් බෙදාහරින්නන්, නිෂ්පාදකයින් හා කොන්ත්‍රාත්කරුවන් ද 2024 වර්ෂය සඳහා ලියාපදිංචිවීමට අලුතෙන් ඉල්ලුම් කළ යුතුය.

(iv) ඉදිකිරීම්, අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (CIDA) හෝ ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ (NCASL) ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉදිකිරීම් වැඩ සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

(v) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇති ගුවන් ගමන් නියෝජිත ආයතන පමණක් ගුවන් ප්‍රවේශපත්‍ර සැපයීමේ සේවා සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලබයි.

(vi) ආරක්ෂක සේවා සැපයීම සඳහා සහ ආරක්ෂක නිලධාරීන් සැපයීම සඳහා පළාත් සභාවල / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචි වී, ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලත් ආයතන පමණක් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

(vii) අයදුම්කරු කොන්දේසි අංක (iv), (v) සහ (vi) සපුරන බව සහතික කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලිවල පිටපත් නිවැරදිව පුරවන ලද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

(viii) අවශ්‍ය සියලුම ලිපිලේඛන ඉදිරිපත් නොකරන සහ අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු ලැබෙන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

(ix) ඉල්ලුම් කළ විට නියමිත වේලාවට මිළ ගණන් ඉදිරිපත් නොකරන හෝ නියමිත වේලාවට භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන, එසේ නැතහොත් සෑහීමකට පත් විය නොහැකි ආකාරයේ භාණ්ඩ හා සේවා සහ අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සපයන ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.

## අයදුම්පත් බාරදීම

(i) ලියාපදිංචි වීම සඳහා ඇති අයදුම්පත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ **https://www.cbsl.gov.lk/en/tenders** වෙත පිවිසීමෙන් ලබා ගත හැක. ලියාපදිංචි වීම සඳහා අදාල නැවත නොගෙවන ලියාපදිංචි ගාස්තු එම අයදුම්පතේ සඳහන් කර ඇත. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන උපදෙස් වෙබ් අඩවියේ සඳහන් කර ඇත.

(ii) නිවැරදිව පුරවන ලද අයදුම්පත් 2023 දෙසැම්බර් 06 දින හෝ ඊට පෙර **supreg@cbsl.lk** වෙත විද්‍යුත් තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් අතින් පුරවා ස්කෑන් කර හෝ විද්‍යුත් ක්‍රමයට පිරවීමෙන් එවිය හැක.

(iii) සියලුම අයදුම්කරුවන් අයදුම්පත් වල දෘඩ පිටපත් එවීමෙන් වැලකී සිටිය යුතුය.

## ලියාපදිංචි ගාස්තු ගෙවීම

(i) අයදුම්කරුවන් තමන් අයදුම් කරන අයිතම සහිත එක් එක් උප කාණ්ඩය සඳහා අදාල ගාස්තු ගෙවිය යුතුය. අවශ්‍ය ගාස්තු ගෙවීමට අපොහොසත් වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වන අතර වැඩිපුර ගෙවන ලද අයදුම්පත් ගාස්තු නැවත ගෙවනු නොලැබේ.

(ii) ලියාපදිංචි ගාස්තු ඕනෑම වාණිජ බැංකුවකින් ගෙවිය හැක.

වැඩිදුර තොරතුරු දුරකතන අංක 011-2477919, 011-2477123, 011-2477599 ඔස්සේ සහකාර ලේකම්/ ප්‍රසම්පාදන අංශය වෙතින් ලබාගත හැක.

**ලේකම්**
**ශ්‍රී ලංකා මහ බැංකුව**